GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580888 / 0714 9995
Fax : 2503588 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@yahoo

17.02.2012

මාධ්‍ය නිවේදනය.

වෛද්‍යවරුන්ගේ සේවා සැළසීමේදී දවසේ කවර වේලාවකදී වුව රෝගියා වෙත හැකි ඉක්මනින් ළඟාවීම සඳහා රෝහල අසළ පදිංචිවීමත් කාර්යක්ෂම ප්‍රවාහනයක් සලසා ගැනීමත් අත්‍යාවශ්‍යවේ. මෙම කාරණා සම්පූර්ණ කර ගැනීම සඳහා වෛද්‍යවරුන්ට පැමිණීමේ සහ ප්‍රවාහනය නමින් දීමනාවක් ලබාදෙයි. වෛද්‍යවරුන්ට විශේෂිතව හිමිවන එකම දීමනාව මෙයවේ.

මෙම දීමනාව දැනට රුපියල් 15000 කි. මේ අනුව වෛද්‍යවරුන්ගේ වැටුප පහත සඳහන් වේ.

| | මූලික වැටුප | දීමනාව | මුළු වැටුප |
|---|---|---|---|
| සාමාන්‍ය වෛද්‍ය | – 26000 | 15000 | 41000 (දළ වශයෙන්) |
| විශේෂඥ වෛද්‍ය | – 42000 | 15000 | 57000 (දළ වශයෙන්) |

වෛද්‍යවරුන්ට සමාන්තර නිලධාරීන්ට (පරිපාලන, නීති, විනිශ්චයකාර) රජයෙන් වාහනයක් ලබාදීමත් රියදුරෙකු සහ ඉන්ධන ලබාදීමත් සිදුවේ. එබැවින් ඉන්ධන මිල ඉහළ යාමකදී ඔවුන්ට ලැබෙන දීමනාව නිරායාසයෙන්ම ඉහළයයි.

නමුත් වෛද්‍යවරුන්ට මෙම රුපියල් 15000 දීමනාව රෝහල අසල පදිංචිවීමට සහ කාර්යක්ෂම ප්‍රවාහනයක් සලසාගැනීමට කිසිදු අයුරකින් ප්‍රමාණවත් නොවන බැවින් එම දීමනාව යථාවත්කරන ලෙස අප විසින් 2007 වසරේදී ඉල්ලා සිටින ලදී. සමාන්තර රජයේ සේවකයෙකුට රජයෙන් ප්‍රවාහනය සැලසීම සඳහා අවම වශයෙන් රුපියල් ලක්ෂයක් ඉක්මවන මුදලක් ලැබෙන බැවින් වෛද්‍යවරුන්ගේ දීමනාව අවම වශයෙන් රුපියල් 29000 දක්වා වැඩිකලයුතු බව අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවැත්වූ සාකච්ඡාවේදී එකඟ විය. නමුත් එවකට පැවති යුද්ධය නිසා එම දීමනාව යථාවත් කිරීමට කල් ගතවන බවට අතිගරු ජනාධිපතිතුමා කල ඉල්ලීමට අපි 2007 දී එකඟ වුණෙමු.

නමුත් අද පවතින තත්වය හමුවේ ඉක්මනින් එම දීමනාව යථාවත් කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් උදක්ම ඉල්ලා සිටිමු.

ස්තුතියි.

වෛද්‍ය චන්දික එපිටකඩුව.
ලේකම්.

වැඩිදුර විස්තර : වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444